# සිද්ධාන්ත සංග්‍රහයේ අන්තර්ගත පද්‍ය උද්ධෘතවලින් ප්‍රතීයමාන වන සිංහල කාව්‍ය සම්ප්‍රදායය පිළිබඳ විමර්ශනයක්

හෙ. ව. බිහේෂ් ඉන්දික සම්පත්

This article focuses on the poetic nature of the *Sidath Sangarawa* with quotations and discussions to ascertain to which poem belongs to which book, tradition and type revealing unknown facts of Sinhala poetry with the aim of arriving at constructive conclusions. *Sidath Sangara Elusandaslakuna* and *Siyabaslakara* will be the primary sources and the ideologies of Sinhala Literature veterans will be discussed as secondary sources at the end of the article. Through the successful conclusion of *Sidath Sangara*, the existence of a great poetry tradition will be proven.

*සිදත් සඟරාව නම් ව්‍යාකරණ ග්‍රන්ථයේ අන්තර්ගත වන පද්‍ය ස්වරූපයේ උද්ධෘත විශ්ලේෂණය කොට ඒවා කවර පද්‍ය කෘතියකට, කවර සම්ප්‍රදායයකට, කවර ආකෘතියකට අයත් වේ ද යන්න සාකච්ඡා කරමින් චිරන්තන සිංහල පද්‍ය සම්ප්‍රදායයේ දැනට විද්‍යමාන නොවන තොරතුරු මතු කොට දැක්වීම හා ඒ පිළිබඳ විශ්වසනීය උපන්‍යාස පළ කිරීම මෙම ලිපියේ අරමුණයි. මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් සිදත් සඟරාව, එළුසඳස්ලකුණ, සියබස්ලකර ආදි මූල ග්‍රන්ථත්, ද්වෛතීයික මූලාශ්‍රය වශයෙන් ඒවා පිළිබඳ විද්වත් මතවාද ආදියත් යොදා ගෙන තිබේ. සිදත් සඟරා පද්‍ය ආශ්‍රයෙන් උසස් පද්‍ය සම්ප්‍රදායයක් පිළිබඳ සාධක අනාවරණය කෙරෙන බව මෙහි අවසානයේ නිගමනය කෙරේ.*

---

© ආචාර්ය හෙ. ව. බිහේෂ් ඉන්දික සම්පත්

සංස්. ආචාර්ය පූජ්‍ය මීමුරේ ගුණානන්ද හිමි, මහාචාර්ය ඊශා හේවාබෝවල, මහාචාර්ය සුසන්ත මහඋල්පත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක

මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 20 කලාපය, 2012/13, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

"කෘ" ධාතුවට "වි" හා "ආ" යන අව්‍යයන් පූර්ව වීමෙන් ද තත්ශීලාර්ථයේ "අන" කෘදන්තය පර ව යෙදීමෙන් ද "ව්‍යාකරණය" යන වචනය නිෂ්පාදනය වී තිබේ. ඉන් අදහස් කෙරෙන්නේ භාෂාව හොබවන්නා වූ ධර්මතා සමුදායයි. භාෂාව විධිමත් ව භාවිත කිරීම සඳහා ඉවහල් වන රීති පද්ධතියක් වශයෙන් ද "ව්‍යාකරණ" යන්න අර්ථ දැක්විය හැකි වේ. සිංහලයේ දැනට විද්‍යමාන, ව්‍යාකරණය පිළිබඳ ව පැවසෙන පැරණිතම ග්‍රන්ථය වනුයේ සිදත් සඟරාවයි. සිදත් සඟරාව යන්නෙහි නාමාර්ථය "සිද්ධාන්ත සංග්‍රහ කළා වූ ග්‍රන්ථය" යනුයි.

දඹදෙණි යුගයේ පතිරාජ පිරුවෙන්පති හිමියන් විසින් රචනා කරන ලද සිදත් සඟරාව පොදුවේ සිංහල භාෂාව හා බැඳුණු අක්ෂර, පද, සන්ධි ආදි සමස්ත ව්‍යාකරණ සිද්ධාන්ත ඉදිරිපත් කිරීමට ප්‍රයත්න කළ ග්‍රන්ථයක් නොවන බව පැහැදිලි ය. අනෙක් අතට "ව්‍යාකරණ" යන්න පුළුල් අර්ථයෙන් ගත් කල ඡන්දස්, අලංකාරාදි ලක්ෂණ ද ඊට අන්තර්ග්‍රහණය වෙයි. මේ කරුණු සැලකීමේ දී කව්ලැකිය ප්‍රමුඛ කොට ගනිමින් එකී සිද්ධාන්ත පැහැදිලි කිරීම සිදත්කරුවාගේ අභිප්‍රාය වූ බව පැහැදිලි ය.

මෙහි දී අපගේ අවධානය යොමු වන්නේ සිද්ධාන්ත සංග්‍රහයේ අන්තර්ගත පද්‍යමය නිදර්ශන පිළිබඳ වයි. ඒවා උපුටා ගත් බොහෝ මුල් කෘති අද වන විට නෂ්ටප්‍රාය වී ඇතත් දඹදෙණි යුගය වන තෙක් ඒවා රසික ලෝකයා අතර පැවතියේත් සිදත් කරු එම කෘතිවල පාඨ උද්ධෘත කොට ගත්තේත් ඒවා උසස් සාහිත්‍ය ලක්ෂණ ප්‍රකට කළ බැවින් විය යුතු ය. එකී පද්‍ය කෘති සංක්‍රමණික අවධීන් තුළ විවිධ සංහාරයන්ට ලක්වීමෙන් හා ස්වාභාවික ආපත්තීන් හේතුවෙන් විනාශ ව ඇති නමුදු යථෝක්ත උද්ධෘත ආශ්‍රයෙන් චිරන්තන සිංහල පද්‍ය සම්ප්‍රදායය පිළිබඳ ව අවබෝධයක් ලබා ගත හැකි වේ. තද් යුගයෙහි ම ප්‍රබන්ධිත එළුසඳස්ලකුණ ද මෙබඳු ම වූ ප්‍රබල මූලාශ්‍රයයකි.

සිද්ධාන්ත සංග්‍රහයේ අන්තර්ගත පද්‍ය උද්ධෘත ප්‍රකාර කිහිපයකින් යුක්ත වන්නේ ය. එක් ප්‍රකාරයක් නම් සම්පූර්ණ වශයෙන් ඇතුළත් කොට ඇති උද්ධෘත, අර්ධ වශයෙන් ඇතුළත් කොට ඇති උද්ධෘත, වචන කිහිපයකට සීමා වන උද්ධෘත යනුයි. තවත් ප්‍රකාරයක් ලෙස

මුල් කෘතිය විද්‍යමාන වන, මුල් කෘතිය නාම මාත්‍රික ව සඳහන් වන, මුල්කෘතිය අනුමාන බුද්ධියෙන් දත හැකි, මුල්කෘතිය පිළිබඳ ව කිසිවක් අනාවරණය කර ගත නොහැකි යනාදී වශයෙන් ද උද්ධෘත වර්ග කළ හැකි වේ. එමතු ද නොව කාව්‍ය සම්ප්‍රදායය සලකා උපදේශ කාව්‍ය, මහා කාව්‍ය, සන්දේශ කාව්‍ය, ආදී කාව්‍ය ප්‍රභේද යටතේ ඒවා වර්ග කිරීමට ද පිළිවන. අනන්‍යතාව අප්‍රකට ව පවත්නා ඇතැම් පද්‍ය ස්වරූපයේ උද්ධෘත අතර සිදත් සඟරා කතුවරයාගේ ප්‍රබන්ධ ද පවතිනවා විය හැකි ය.

මුවදෙව්දාවත කව්සිළුමිණ වැනි දැනට විද්‍යමාන පද්‍ය කාව්‍යවලින් මෙන් ම නෂ්ටප්‍රාය ව ඇති අසක්දා කව, පුරාණ මයුර සන්දේශය වැනි කෘතිවලින් ද සිදත් කරු ගද්‍ය හා පද්‍ය කොටස් උද්ධෘත කොට ගෙන තිබෙනු පැහැදිළි ව ම නිරීක්ෂණය කළ හැකි ය. මුවදෙව්දාවත හා කව්සිළුමිණ මහා කාව්‍යසම්ප්‍රදායයට අනුගත ව ලියැවී ඇති බව ප්‍රත්‍යක්ෂ ව ඇති නමුදු ඊට පූර්ව යුගයකට අයත් අසක්ද කව වැනි කෘති වෙනම ම පද්‍ය සම්ප්‍රදායයකට අයත් වන බව පෙනේ.

සිදත් සඟරාවේ කව්ලැකියෙහි අනුස්වාරයේ භාවිතය කියා පෑමට නිදර්ශනත්වයෙන් දක්වා ඇති ***"නරනිඳුහු ඉංගෙන් - සෙමෙනද නැසී පසැහී"***[1] යන පාඨය කව්සිළුමිණෙන් උද්ධෘත කොට ගත්තකි. සාගල නුවරට පැමිණි පබාවතිය දැක සතුටට පත් වූ අයුරු දක්වා ලන එය සිව් වන සර්ගයට ඇතුළත් වන්නකි.

"නරනිඳුහු ඉංගෙන් සෙමෙනද නැසී පසැහී
විලස කළ ළඟ කප්තුරු මද ලෙල හෙම්ලිය කලබ"[2]

*(පබාවතිය රජුගේ කැමැත්ත පරිදි සෙමෙන් අවුත් නොපෙනෙන ලෙස මුවා වී පාර්ශ්වයෙහි සිට කල්ප වෘක්ෂ අසල වූ මඳක් ලෙළ දුන් රත්රන් ලතා කලාපයක ශෝභාව දැක්වූවා ය.)*

මෙම ගීයෙහි පාදවල මාත්‍රා ගණන් සැලකීමේ දී (9, 11, 11, 11) එළුසඳස්ලකුණේ දැක්වෙන ගී විරිතට අයත් කළ හැකි වේ.

උක්ත ගී අඩ හැරුණු කල සිදත් සඟරාවේ ඇතුළත් තවත් ගී දෙකක් කව්සිළුමිණෙන් උද්ධෘත කොට ගෙන ඇති බවට මත පළ ව තිබේ. ඒ විශේෂණ-විශේෂ්‍යාධිකාරයේ සමානාධිකරණ හා භින්නාධිකරණ විශේෂණ-විශේෂ්‍ය සඳහා නිදර්ශනත්වයෙන් දක්වා ඇති පහත ගී දෙක පිළිබඳ වයි.

*"නමව් මුනිඳු තුමා - තුමා සිරින් පබසරා*
*සරා සිසිකල් දසනා - සනාරෙසෙනදහු දියේ"*

*"නමව් පිරිසිඳ සැබ - විනයූඅනාවත්මන්*
*පදඅතුනෙකකෙණේ දත් - පවරමුනි රජහු සරණ"* [3]

කව්සිළුමිණෙහි ආරම්භක ගීත කිහිපයක් කාලයාගේ ඇවෑමෙන් ගිලිහී ගොස් ඇතැයි පවසන සෝරත හිමි උක්ත ගී දෙකෙන් එකක් එහි ප්‍රාරම්භක පද්‍යය විය හැකි බව පවසයි.[4] එහෙත් ඇම්. බී. ආරියපාල පවසන්නේ කව්සිළුමිණෙහි දැනට විද්‍යමාන වන ආරම්භක ගීය කවියාගේ කවිත්වයට හා ව්‍යවහාර ඥානයට ගැළපෙන සේ පබැඳුණු, ලෝක ස්වභාවය ප්‍රකාශ කෙරෙන ඖචිත්‍ය පූර්වක වූ ආරම්භයක් බවයි.[5]

සෝරත හිමිගේ අදහස හුදු මතවාදයක් පමණක් වන බැවින් සිදත් සඟරා පද්‍යද්වය කව්සිළුමිණෙහි ම වී යැයි සපුරා පිළිගත නොහේ. එතෙකුදු වුවත් ඒවායෙනුදු උසස් කවිත්වයක් ප්‍රකට වනු දැක ගත හැකි ය. ඉන් පළමු වැන්න භාෂාව වශයෙන් ගත් කල කව්සිළුමිණෙහි භාෂාවට වඩාත් සමීප වෙයි. සන්දෂ්ට යමකය ඇසුරු කොට ගෙන ඇති එම ගීයත් සෙසු ගීයත් ගී විරිත ආශ්‍රයෙන් ප්‍රබන්ධිත ය. සන්දෂ්ට යමකය නම් පසු පාදයන්හි ආරම්භයන් විසින් පෙර පාදයන්හි අන්තයන් ඩැහැ ගනු ලබන කාව්‍ය ලක්ෂණයයි.[6] ඒ අනුව මෙහි ඒ ඒ පාදවල අවසානය ඊළඟ පාදයේ ආරම්භය හා සමාන ව යෙදේ.

සෝරත හිමිගේ මතය පිළිගන්නේ නම් ඊට එකඟ විය හැක්කේ උක්ත පළමු පද්‍යය සම්බන්ධයෙනි. තම සිරින් පබසර සරා සිසි සදිසි කල් දසුන් ඇති ලොවැසියන් කෙරෙහි සෙනෙහෙ නම් දියෙන්

තෙත් වූ මුනිඳුන් නමඳින්නැ'යි පවසන පළමු පද්‍යය අලංකාරෝක්තිවලින් යුක්ත වූවකි. එහි භාෂාව සෞම්‍ය ගුණයෙන් ද ලාලිත්‍යවත් භාවයෙන් ද හොබනේ ය. දෙවැන්න උපමා, රූපකාදි අලංකාරයන්ගෙන් විහීන ව ස්වභාවෝක්ති මාර්ගයට අනුරූප ව ඉදිරිපත් කරන්නා වූ තරමක් රළු බසකින් යුක්ත වන පද්‍යයකි. මෙම පැදි දෙක සිදත්කරුවාගේ ම ප්‍රබන්ධ නොවී නම් ඒ වන විට පැවති මහා කාව්‍ය, ඛණ්ඩ කාව්‍යාදියේ ප්‍රාරම්භ නමස්කාර විය හැකි ය. පැහැදිලි ව ම වෙන් වෙන් වූ පද්‍ය සම්ප්‍රදායයන් දෙකක් මේ පද්‍යද්වයෙන් නිරීක්ෂණය කරනු හැකි වේ.

මුවදෙව්දාවතෙහි ප්‍රාරම්භ නමස්කාරයෙන් කොටසක් ද සිදත් කතුවරයා උද්ධෘත කොට දක්වා තිබේ. ඒ සන් අදියරෙහි "අඩු නම් මත් අඩු" යන සිද්ධාන්තය පැහැදිලි කිරීමට නිදර්ශනත්වයෙන් දක්වා ඇති ***"නුවණ නිසයුරා"***[7] යන්නයි. මෙහි "නී සයුරා" යන්න මාත්‍රා හානියෙන් නිසයුරා බවට පත් ව ඇති බව ය, ඔහු පවසා ඇත්තේ. මුවදාවත ආරම්භයට ම යෙදී ඇති එම පද්‍යය මෙලෙසිනි,

"නුවණ නිසයුරා-විනේ කුමුදු නිසයුරා
කෙලෙස් තුසර දිවයුරා-බව දුක් ලැව් අගයුරා"[8]
*(නුවණ නම් නදීන්ට මුහුදක් වූ විනේය ජනයා නමැති*
*කුමුදු මල්වලට සඳ වැනි වූ කෙලෙස් නම් පිනි වියලවන*
*හිරු වන් වූ සසර දුක නම් වනයට ගින්නක් වූ...)*

රූපකාවලියක් ආශ්‍රයෙන් බුදුන් වහන්සේ වර්ණනා කරන්නා වූ මෙම පද්‍යය මාත්‍රා 8, 11, 11, 11 යන පිළිවෙළින් යුක්ත වන සේ එළිසම කොට ගජගැමි විරිතට අනුව බඳනා ලද්දකි.[9]

දැනට විද්‍යමාන වන, මහා කව්‍ය සම්ප්‍රදායයානුගත ව ප්‍රබන්ධිත මෙම කාව්‍ය කෘතීන්ගෙන් උද්ධෘත කොට ගත් පාඨවලට සමානතා දක්වන තවත් පාඨ කිහිපයක් ද සිද්ධාන්ත සංග්‍රහයෙහි දක්නට ලැබේ. ඉන් පාඨද්වයක් මෙසේ ය.

***"සරණ තඹර වරලස-සෙවෙලවල කැරැ අරියන***
***රඳුව පෙර කළ වමන්-කුස නිරිඳු නොසමළෝ"*** [10]

*"තළා කෙළියෙහි-තරඟ දෙබෙරා*
*බට පබවත වත-තඹරානට නිගා දින්"* [11]

මින් පළමු පාඨය විභක්ත්‍යධිකාරයේ කර්තෘ විභක්තියට සම්බන්ධ අ' ප්‍රත්‍යය සඳහා (රඳුව) නිදර්ශනත්වයෙන් දක්වන ලද්දකි. පාපියුම කෙහෙ නම් සෙවෙලින් ආකුල කොට ඇරියුම් කරන කල්හි ඇය පෙර කළ අවමන් කුස රජ සිහි නොකළ බවක් ඉන් කියැවේ. දෙවැන්න ද විභක්ත්‍යධිකාරයේ ම සම්ප්‍රදාන විභක්තියට සම්බන්ධ ආනට ප්‍රත්‍යය සඳහා (තඹරානට) නිදර්ශනත්වයෙන් දක්වන ලද්දකි. දිය කෙළිය සඳහා තරඟ දෙබෑ කොට බට පබාවතියගේ වත පාපියුමන්ට නිගා දුන් බව ඉන් පැවසේ.

කව්සිළුමිණට ඇතුළත් නොවන මෙම පාඨද්වය කුස ජාතකය මූලාශ්‍රය කොට ගනිමින් රචනා වී තිබෙනු දැක ගත හැකි ය. ඇතැම් විට ඒවා සිදත් සඟරා කතුවරයාගේ ම ප්‍රබන්ධ වීමට පිළිවන. නොඑසේ නම් ඒ වන විට පැවති වෙනත් කුස ජාතක කාව්‍යයකින් උද්ධෘත කොට ගත්තා වීමට ද පිළිවන. කව්සිළුමිණ හැරුණු කල කුස ජාතකය ඇසුරු කොට ගනිමින් රචනා වූ තවත් පද්‍ය කාව්‍යයන් පැවති බව එළුසඳස්ලකුණින් ද පැහැදිලි වේ. එළුසඳස්ලකුණ ගී විරිත් යටතේ යා ගී විරිත සඳහා දක්වා ඇති පද්‍යය එබඳු එක් නිදර්ශනයකි.

*"කස නිරිඳු එදවස-පිවිතුරු උයනතට වැද*
*වැජඹ වසත ගුණ මුහුදු-නොමඳ දියතට සෙත දිනි"* [12]

තවද සිව්පද විරිත්හි දී සෙල් ඡන්දස යටතේ දක්වන ලද මිණිමල් විරිත සඳහා ඉදිරිපත් කොට ඇති නිදර්ශන පද්‍යය ද කුස ජාතකයේ අවස්ථාවක් කියා පාන්නකි.

"හළ ද බුලත වත, රත ලවනත
මිණිමුතු'පුල පත, පැහැගත නෙත
සිසි කැලුම පත, සිසි වත වත
එ නිරිඳු මන නෙත, ගත පබ වත" [13]

මෙම කරුණු සැලකීමේ දී සිදත් සඟරාවෙන් උපුටා දැක්වූ නිදර්ශන පද්‍ය දෙක ද ඒ යුගය වන විට පැවති කුස ජාතක කාව්‍යයකට ඇතුළත් වී යැ'යි සිතිය හැකි ය. මෙම පද්‍ය සතර ම එක් කාව්‍යයකට අයත් විණි දැ'යි හෝ කාව්‍ය කිහිපයකට අයත් විණි දැ'යි හෝ නිශ්චිත ව කිව නොහේ. එසේ ද වුවත් අවසන් පද්‍යය සිව්පද විරිතකින් ද සෙසු පද්‍යයන් ගීවිරිත්වලින් ද රචනා වී තිබීමෙන් ඒවා යටත් පිරිසෙයින් කාව්‍ය ග්‍රන්ථ දෙකකට වත් අයත් විය යුතු බව සිතීමට පිළිවන.

සිදත් සඟරාවෙන් දැක්වූ නිදර්ශන පද්‍ය දෙක ගී විරිත් අනුව රචනා වී ඇතත් ඒවා එළුසඳස්ලකුණේ දැක්වෙන විරිත් නොවේ. පළමු පද්‍යය මාත්‍රා 10, 11, 10, 10 යන පිළිවෙළින් යුක්ත වේ. ධර්මාරාම හිමි එහි පළමු පාදයේ දක්වා ඇති "වරලස" යන්න කුමාරතුංග මුනිදාස ඇතුළු බොහෝ සංස්කාරකවරුන් දක්වා ඇත්තේ "වරල" යනුවෙනි.[14]

එසේ ගැනීමෙනුදු එළුසඳසේ එන විරිතක් නොලැබේ. දෙවන උද්ධෘතය ඉහත ආකාරයෙන් පාද බෙදා වෙන් කොට ප්‍රථම පාදයේ අන්තාක්ෂරය දීර්ඝත්වයෙන් ගත් විට පාද සතරෙහි 8, 8, 8, 11 යන මාත්‍රා අගයයන් දක්නට ලැබේ. ඒ අනුව එය ද එළුසඳසෙහි නොදැක්වෙන ගී විරිතකි. එසේ ද වුවත් එය 8, 8, 8, 13 යන මාත්‍රා අගයයන්ගෙන් යුක්ත වන මත්වල ගී විරිතට[15] තරමක් සමාන වනු පෙනේ.

සිදත් සඟරා නිදර්ශනද්වයෙන් දෙවැන්න දියකෙළි වැනුමකට සම්බන්ධ කළ හැකි ය. පළමු වැන්නෙහි වර්ණනා පරිසරය සැලකීමේ දී එය ද දියකෙළි වැනුමකට හෝ මනදොළ කෙළි වැනුමකට හෝ අයත් විය යුතු බව සිතීමට පිළිවන. එහෙත් මෙම පද්‍ය දෙක අතර අන්‍යොන්‍ය සම්බන්ධතාව හෝ ඒවායේ අවස්ථා සම්බන්ධය පැහැදිලි නැත. පළමු පද්‍යයෙහි "සරණ තඹර", "වරලස සෙවෙල" යන තන්හි රූපකාලංකාරය ද දෙවැන්නෙහි "පබවත වත තඹරානට නිගා දින්" යන තන්හි නින්දෝපමාව[16] හා "පබවත වත" යන්නෙහි අව්‍යපේත යමක ලක්ෂණය[17] ද යෙදී තිබේ. පද්‍ය දෙක ම සම්ප්‍රභෝග ශෘංගාර රසයෙන් පරිපූර්ණ ය.

දැනට නෂ්ටප්‍රාය වී ඇති ඉපැරණි සිංහල පද්‍ය කාව්‍ය දෙකක් වන අසක්දා කවෙන් හා පුරාණ මයූර සන්දේශයෙන් උද්ධෘත කොට ගැනුණු පාඨ ගණනාවක් ම සිදතෙහි දක්නට පිළිවන. අසක්දා කව අග්බෝ රජු කල (ක්‍රි. ව. 564-598) හුන් දොළොස් මහ කවීන්ගෙන් අයකු වූ අසක්දා මල විසින් රචනා කරන ලද්දකි. අසක්දාමල ඇතුළු දොළොස් මහ කවීන් පිළිබඳ ව ගම්පොළ යුගයේ ද්විතීය ධර්මකීර්ති හිමියන්ගේ නිකාය සංග්‍රහයේ ද සඳහන් ව තිබේ. අසක්දා කවට වස්තු වී ඇත්තේ ආසංඛ්‍යවතී ජාතකයයි. ජාතක කථා සංග්‍රහයේ 378 වැන්න[18] වශයෙන් ඉදිරිපත් වන එම ජාතක කථාව ගැඹුරු ආධ්‍යාත්මික ධර්මතාවක් කුළු ගන්වන මනෝරම්‍ය කථා ප්‍රවෘත්තියකි. තරුණියක දුහිතෘත්වයෙන් රක්ෂා කරන තාපසයකු වෙත පැමිණෙන රජෙක් ඇය තමාට භාර දෙන මෙන් තවුසාගෙන් ඉල්ලා සිටී. තවුසා පවසන්නේ ඇයගේ නම කීමට සමත් වන්නේ නම් රැගෙන යාමට ලැබෙන බවයි. රජු තම පිරිස සමග කැලයේ ම නවාතැන් ගෙන නම් සියදහස් ගණනක් සිහිපත් කරමින් කීව ද ඇගේ නමට සමාන නොවේ. පරිසරයෙන් ද දැඩි පීඩා විඳින රජතුමා පෙරළා යාමට සූදානම් වන අවස්ථාවේ දී "තම ආශාව ඉටු කර ගෙන නොගෙන යළිත් හිස් අතින් නොයන්න යැ"යි කුමරිය කියා සිටී. අවසන් ම වතාවේ ඇය වෙත යන රජතුමා පවසන්නේ, "එම්බල කුමාරිකාව, තීගේ නම සොයා කියෙමි යන උත්සාහයෙන් දැන් තුන් අවුරුද්දක් පලා ගියේ ය. මෙදෑතුරෙහි තිගේ බසෙහි බැඳී උන් පමණක් විනා පංචකාමයෙන් රැඳුණු ගමනෙක් නොවෙයි. නිකන් බසින් ප්‍රයෝජන කිම් ද?, මාගේ ආසාවෙහි පූර්ණත්වයක් නැති වුව මාගේ නුවරට යෙමි" යනුවෙනි. එම අවස්ථාවේ රජු කීයේ ඇගේ නම බවත් එය තවුසාණන්ට පවසා තමා රැගෙන යන ලෙසත් කුමරිය කී විට ඇගේ නම "ආසංඛ්‍යවතී" යන්න බව තේරුම් ගන්නා රජතුමා කුමරිය ලබා ගැනීමට සමත් වේ. පළමු ව කුමරිය තම නම ඉඟි කරත්දීත් රජුට එය තේරුම් ගත නුහුණේ අධික ආශාවෙන් මත් වූ බැවිනි. අවසානයේ ආශාව පහ ව ගිය කල්හි ය, ඇගේ නම කියා ගත හැකි වන්නේ. ජාතක කථාවේ දැක්වෙන මෙම මුඛ්‍ය සිදුවීම විවිධාකාරයෙන් විග්‍රහ කරනු හැකි වේ.

අසක්දා කවෙන් උපුටා ගන්නා ලද නිදර්ශන හතරක් සිදත් සඟරාවේ දක්නට ලැබේ. පණකුරු-ගකුරු පිළිබඳ ව සඳහන් කිරීමේ

දී කව්ලැකියේ අනුස්වාරය ව්‍යවහාර වන ආකාරය ප්‍රකාශ කිරීම සඳහා,

*"තමා වදනය පොමින් - නොඉකතැයි හැංගේ"*[19] යන පාඨයත් සන් අදියරෙහි පණකුරු හකර දෙකට සමපා හැදින්වීමේ දී

*"රතත දිදී ඉහිල්-වසනතුරෙන් රසන්දම්*
*කියව කර හලළා-පැහැබර දිගු නුවන් ලා"*[20] යන ගීයත් යව්' ඈ සමස් විග්‍රහයේ දී ඊට නිදර්ශන වශයෙන්,

*"සක් කැබලි සියො අඟිනි-එක්පසක් යව්දිව්"*[21]
*"තුනු හොළවට හළ-යතලබ සතොස් සිත් හළ"*[22] යන පාඨත් ඉදිරිපත් කොට තිබේ. අසක්දා කව දැනට නෂ්ටප්‍රාය වී ඇතත් සිදත් සඟරා කරු මෙම පාඨ ඉන් උද්ධෘත කොට ගෙන ඇති බව නිශ්චය වශයෙන් දත හැකි වනුයේ සිදත් සඟරාවට සන්න සැපයූ පුරාණ සන්නකරුවා ඒ තහවුරු කොට ඇති බැවිනි.

උක්ත පළමු පාඨයේ අර්ථය "තමාගේ වචනය ප්‍රභූත්වය හේතුවෙන් නොඉක්මවනු ඇතැයි සිතුවේ ය" යන්නයි. එය රජතුමාගේ සිතුවිල්ලක් වශයෙන් ඉදිරිපත් කෙරෙන්නට ඇතැයි සිතිය හැකි ය. කුමාරතුංග මුනිදාස එකී පාඨයේ දැක්වුණු "පොමින්" යන්න ඉදිරිපත් කොට ඇත්තේ "පෙමින්" යනුවෙනි.[23] එම පාඨාන්තරයට අනුව "ප්‍රේමය හේතුවෙන්" යනුවෙන් වෙනස් ලෙසකට අර්ථ දැක්විය යුතු වේ. එසේ ම "හැංගේ" යන්න පුරුෂ හෝ ස්ත්‍රී ලිංග යන දෙකෙහි ම ගත හැකි සේ පෙනෙන බව පවසන ගුණදාස අමරසේකර එය රජතුමා පෙරළා නුවරට යාමට සූදානම් වන අවස්ථාවක දී කුමරිය කළ ප්‍රකාශයක් වශයෙන් දක්වයි.[24]

දෙවනු ව දක්වා ඇති ගීයේ අර්ථය "ලිහිල් වූ වස්ත්‍රය අතරින් අත් දෙක මෙවුල් දමට යොමු කොට ගෙල සලිත කර දීප්තිමත් දිගු නුවන් යොමු කොට කියනු මැනවි" යනුයි. එය රජතුමා කුමරියගේ නම පිළිබඳ විමසා සිටි අවස්ථාවකට හෝ කාව්‍යයේ අවසාන භාගයේ ඔවුන්ගේ සමාගමය සිද්ධ වූ අවස්ථාවකට හෝ සම්බන්ධ කළ හැකි බව පෙනේ.

තුන් වන පාඨයට "ශරීරයෙහි එක් පැත්තක් දිවි ඇති තෙක් පවතින කුෂ්ඨ රෝගයකින් යුක්ත ය." යනුවෙන් අර්ථ දිය හැකි වේ. ඒ අනුව

එය රජ, කුමරියගේ නාමය කියා ගත නොහැකි ව වනයේ දුක් වෙදනා විඳි අවස්ථාවකට සම්බන්ධ කිරීමට පිළිවන. සිව් වන පාඨයේ ''ශරීරයට වේදනා දීම හළේ. ලද ලාභයෙන් සතුටු සිත ද හළේ'' යන අර්ථය ගැබ් ව පවතී. රජු ඉච්ඡා භංගත්වයට පත් ව පෙරළා තම රාජ්‍යයට පිටත් ව යාමට සූදානම් වූ අවසන් අවස්ථාවට එම පාඨය සම්බන්ධ කළ හැකි බව පෙනේ.

අසක්දා කව සංස්කෘත අලංකාර ශාස්ත්‍රය මෙරට ප්‍රචලිත වීමට පෙර අවධියක රචනා වූ බැවින් ජන කාව්‍ය සම්ප්‍රදායය බඳු අව්‍යාජ, නිර්මල කාව්‍ය සම්ප්‍රදායයකට අනුව එය ලියැවී තිබෙන්නට ඇතැයි ඉහත පද්‍ය අධ්‍යයනයේ දී හැඟේ. ඒවායේ උපමාදි අලංකාර දක්නට නොලැබේ. ස්වභාවෝක්ති මාර්ගයට මූලිකත්වය දී රචනා වී තිබෙනු පෙනේ. එහෙත් කවියාගේ වචන සංයෝජනයේ සූක්ෂ්ම භාවය තුළින් පැන නඟින සුගේයතාවක් ද ඒවායේ දක්නට ලැබේ. ඉහිල් වසන්, රසන්දම්, දිගු නුවන් ඈ වදන් එම යුගයේ පද්‍ය සිංහලයේ භාවිත හෙළ බසෙහි අනන්‍යතාව කියා පායි. අවසන් උද්ධෘතයේ එළිසමය ද යොදා ගෙන තිබේ. එළිසමය ගී විරිතෙහි අනිවාර්යයාංගයක් නොවූවත් එම යුගය වන විට ද සිංහල කවීන් අතර එළිසමය ජනප්‍රිය ව පැවති බවක් ද ඉන් හඟිනු හැකි වේ. උක්ත ගී සතර ම අඩසම විරිත් අනුව රචනා වී ඇති බව පෙනේ. ''රතත දිදී ඉහිල්'' යන ගීයේ සමපාද මාත්‍රා 9 බැගින් ද විෂම පාද 11 බැගින් ද (9, 11, 9, 11) යුක්ත වේ. "තුනු හොළ වට හළ" යන්නෙහි ද වනුයේ එම මාත්‍රා අගය (9, 11) මැයි. සෙසු ගීත ඛණ්ඩ දෙක ම 10, 9 යන පිළිවෙළින් යුක්ත වේ.

ගුණදාස අමරසේකර පවසන්නේ අසක්දාකව සිංහල කවීන්ට ම අනන්‍ය අලංකාරයක් වූ උබබස්ලකර මූලික කොට ගෙන රචනා වී ඇති කාව්‍යයක් බවයි.[25] උබබස්ලකර හෙවත් උභය භාෂා අලංකාරය පිළිබඳ ව විචාරකයන් විවිධ අදහස් පළ කොට තිබේ.[26] එහෙත් සිදත් කරු එනමින් දක්වා ඇත්තේ උත්තර-ප්‍රත්‍යුත්තර කියා ගන්නා වූ දෙදෙනෙකුගේ සංවාදාවසානයේ කිසියම් චාරිත්‍ර විශේෂයක් ප්‍රකට කිරීමයි.[27] අසක්දාකවෙහි ද එම අලංකාරය යෙදී ඇති බව "කියව කර හළලා - පැහැබර දිගු නුවන් ලා" ආදි පාඨ අධ්‍යයනයේ දී හැඟී යතත් උබබස්ලකර පිළිබඳ ව අමරසේකර දක්වන්නේ සාවද්‍ය අර්ථ විග්‍රහයකි.

පුරාණ මයූර සන්දේශයෙන් උද්ධෘත කොට දක්වන පාඨ කිහිපයක් ද සිදත් සඟරාවෙහි දක්නට ලැබේ. අද විද්‍යමාන වන මයූර සන්දේශය 14 වන සියවසෙහි එනම් ගම්පොළ යුගයේ දී කවීශ්වර හිමියන් විසින් ලියන ලද්දකි. එහෙත් උක්ත මයූර සන්දේශය අනුරාධපුර යුගයට අයත් වන දැනට අභාවප්‍රාප්ත කාව්‍යයකි. සිදත් සඟරා සන්න කරු ප්‍රකාශ කරන පරිදි සිදතෙහි පෙරළි විදියෙහි දී කිරිය පෙරළියට නිදසුන් ව දක්වා ඇති,

***"මොනරිඳු එකල්හි පුල්සලගැ නවා ගනි"*** [28]

*(මයුරේන්ද්‍රය, ඒ කාලයෙහි පිපියා වූ මල් ඇති සල් රුකක් මුදුනෙහි නිවාස ග්‍රහණය කරව.)*

යන පාඨයත් පියෙවි හ'කර හැඳින්වීමෙහි දෙ වන අවස්ථාව වූ පණකුරු හකර දෙකට සම පා හැඳින්වීමෙහි දී නිදසුන් ව දක්වා ඇති,

***"කළවන් බිඟු මහත්වන හිරු හත්වන"*** [29]

(හිරු අස්තයට ගිය කල්හි භෘංගයන්ගේ කාලවර්ණය මහත් වන්නේ ය)

යන්නත් සිදත් සඟරා කරු මයූර සන්දේශයෙන් ලබා ගන්නා ලද ගී කොටස් දෙක වශයෙන් හඳුනා ගැන්මට හැකි වී තිබේ. එහෙත් විබත් අදියරෙහි කර්‍මපදාර්ථයට ආන ප්‍රත්‍යයෙන් නිදර්ශන වශයෙන් දක්වා ඇති,

***"නරඹන්නැ මොනරාන නස්නා"*** [30]

(නටන්නා වූ මයූරයන් නිරීක්ෂණය කරන්න)

යන පාඨය ද පුරාණ මයූර සන්දේශයෙන් ම උපුටා ගන්නා ලද්දකැයි යූ. ඩී. ජයසේකර අදහස් කරයි.[31] එහි නටන්නා වූ මයූරයන් නිරීක්ෂණය කරන්නැයි පවසා සිටින්නේ ප්‍රස්තුත භාරකයාට ම දැයි සපුරා කිව නොහැකි වෙතත් සැළලිහිණි සන්දේශයෙහිදු එහි භාරකයාට "පත් ගන පුල් මල් දොඹ තුරෙක පිය කරු - සිත් පිනවා ඉඳ සැළලිහිණින් අතුරු"[32] ආදි වශයෙන් ස්වකීයයන් හා චිත්ත ප්‍රමුදිත වන්නැ'යි ප්‍රකාශ කෙරෙන අවස්ථාවක් දක්නට ලැබේ. සිදත් සඟරාවේ ප්‍රත්‍යයාධිකාරයේ මුසු කිරිය හා සබැඳි "මින" ප්‍රත්‍යයට නිදර්ශන වශයෙන් දක්වා ඇති ***"සිකිනට පියමින"***[33] යන්න ද පුරාණ මයූර සන්දේශයෙන් උද්ධෘත කොට ගත්තක් බව සිතිය හැකි වනුයේ එම පද්‍ය කොටස ඇතුළත් පද්‍යය එළුසඳස්ලකුණෙහි අන්තර්ගත ව ඇති බැවිනි.

දිය ඇස අ දි මි න ගල් නැගෙමින දෙව්දුවක වෙමිනා
ගිරි හිස නැගෙමින පිල් වටමින සිකිනට පිය මිනා
තුරු හිස ලැගෙමින විල් විදිමින කඩුපුලෙක වෙමිනා
ස ර ත ස නිව මි න කල් තබමින යත එත රිසි මෙනා[34]

සඳස්ලකුණකරුවා හිරු ඡන්දසට අයත් දිගහුරු විරිත සඳහා නිදර්ශනත්වයෙන් දක්වා ඇති මෙම පද්‍යය පුරාණ මයූර සන්දේශයේ තිබූවක් බව නිසැක වශයෙන් පැවසිය හැකි යැ'යි සුචරිත ගම්ලත් ද ප්‍රකාශ කොට තිබේ.[35]

සිදත් සඟරාවේ අන්තර්ගත තවත් පාඨ කිහිපයක් ද පුරාණ මයූර සන්දේශයෙන් උද්ධෘත කොට ගෙන ඇත් දැ'යි සංශයක් උපදී. සන් අදියරෙහි වෘද්ධි ලක්ෂණය පැහැදිලි කිරීම සඳහා නිදර්ශනත්වයෙන් දක්වා ඇති ***"මලවල සල සිහිලේහී"***[36] (මල් ගැවසුණු සල්හි සිහිලසෙහි) යන පාඨය හා ක්‍රියාධිකාරයෙහි ඊ' යන පූර්වක්‍රියා ප්‍රත්‍යයට නිදර්ශනත්වයෙන් දක්වා ඇති ***"ගිරිනිල් මල් කෙනෙකැයි සැකී"***[37] (ගින්නේර පුෂ්පමය හෙවත් කටරොළු මලින් කරන ලද සත්ත්ව කෙනෙකැ'යි සැක කොට) යන පාඨය එලෙස පුරාණ මයූර සන්දේශයෙන් උද්ධෘත කොට ගත්හ'යි හැඟේ.

එම නිදර්ශන ද උසස් පද්‍ය කාව්‍යයක නෂ්ටාවශේෂ වශයෙන් සැලකීමෙහි දොසක් නැත. එම බොහෝ පාඨ ස්වභාවෝක්ති මාර්ගයට අනුගත ව ඇති නමුදු "ගිරිනිල් මල් කෙනෙකැ'යි සැකී" යන තැන සංශයෝපමාවට සමාන අලංකාර භේදයක් යෙදී තිබේ. එසේ ම කාව්‍යාකෘතිය වශයෙන් ගත් කල මේ දක්වා සිදත් සඟරාවෙන් ඉදිරිපත් කළ බොහෝ උද්ධෘතවලට වඩා මයූරයෙන් දැක්වූ නිදර්ශන පද්‍ය කොටස් විශේෂිත ය. ඒවා සිව්පද පද්‍යවල කොටස් යැයි හැඟී යන බැවිනි. "මොනරිඳු එකල්හි පුල්සලඟ නවා ගණී" යන පාඨය සමුදුරුගොස් විරිතට අනුගත වූවකි. පාදයක් මාත්‍රා දහ අටක් වනුයේ ද මාත්‍රා අටකින් පර ව යති තැබෙනුයේ ද රැඳි නම් ඡන්දසට අයත් සමුදුරුගොස් විරිතයි.[38] "නරඹන්න මොනරාන නස්නා" යන පාඨය පාදයක් මාත්‍රා 14ක් වන සිව්පද විරිතකට අයත් විය යුතු බව පෙනේ. "ගිරිනිල් මල් කෙනෙකැයි සැකී" යන පාඨය "ඊ" ප්‍රත්‍යය සඳහා සිදත් කරු දක්වන නමුදු, යතිය හේතුවෙන් ගුරු

ලුහු වශයෙන් ගත හැකි වීමේ රීතිය සලකා එහි අන්තාක්ෂරය ලඝුවත්වයෙන් ගත් කල එය ද පාදයක් මාත්‍රා 12ක් වන සිව්පද විරිතකට අයත් කළ හැකි වේ.

පුරාණ මයූර සන්දේශය පිළිබඳ ව තව දුරටත් අවබෝධයක් ලබා ගැනීම සඳහා එළුසඳස්ලකුණේ ගී විරිත් යටතේ වම් තොහොල් ගීයට[39] නිදර්ශනත්වයෙන් දක්වා ඇති ගීය ද පිටිවහල් කොට ගත හැකි ය. එය උක්ත මයූර සන්දේශයෙහි දූතාශිර්වාදය හෝ දූත ප්‍රශංසාව වීමට පිළිවන.

**"පවතු සිකි සඳ - පියන් නඳ දුන් කල සෙව**
**පැනට මහවත තුබු - කළෙහි නො කෙලේහි නොකෙලේහි''**[40]

පෙර දැක්වූ පද්‍ය උද්ධෘත හැරුණු කල අනන්‍යතාව පැහැදිලි කොට ගත නොහෙන, එනමුදු උසස් කාව්‍ය සම්ප්‍රදායයක තතු කියා පාන්නා වූ තවත් පද්‍ය උද්ධෘත රාශියක් සිදත් සඟරාවෙහි අන්තර්ගත වේ.

සිදත් සඟරා කරු විබත් පෙරළිය සඳහා නිදර්ශනත්වයෙන් දක්වා ඇති ගීය පහත දැක්වෙන පරිද්දෙනි. ඔහු අදහස් කරන ආකාරයට එහි විබත් පෙරළියක් දක්නට නොලැබෙතත් එය අපගේ විෂයය හා බද්ධ ය.

***"ගතු ගතු ද දුදනෝ - සහකට මැණ සුපුන් මෙන්***
***පිරිරඹැ නිරිඳු මලදා - පරනට බිය මැ රැකුළෝ"***[41]
*(දුදනන් පොත්-පත් උගෙන දැනුම ලද නමුත් කණ්ඨ*
*මාණික්‍ය සහිත සර්පයන් වැනි වූයේ රජු නමැති සඳුන්*
*ගස වැළඳ ගෙන අනුන්ට බියක් ම ගෙන දුන්හ.)*

සංස්කෘත, දෙමළ උපදේශ කාව්‍යයන්හි එන අදහස්වලට ද සමානතා දක්වන මෙම පද්‍යය උපදේශාත්මක කාව්‍ය කෘතියකට ඇතුළත් වූවක් විය හැකි ය. ව්‍යාසකාරයේ එන පහත පද්‍යය ද මෙහි මුල් දෙපෙළට සමාන අර්ථයක් ගෙන දෙන්නකි.

"**දුර්ජනඃ පරිහර්තව්‍යෝ - විද්‍යායාලංකෘතෝපිසන්**
**මණිනාලංකෘතස්සර්පඃ - කිමසෞ න භයංකරඃ**"[42]
*(දුදනා දැනුමින් සැරසුණේ වුවත් දුරු කළ යුතු ය. කණ්ඨ මාණික්‍යයෙන් සරසන ලදත් මේ සර්පයා කෙසේ නම් බිය කරු නොවේ ද?)*

නීති වෙන්බා නම් දෙමළ සදුක්ති ග්‍රන්ථයේ එන 87 වන පද්‍යය ද උක්ත සිදත් සඟරා පද්‍යයට බොහෝ සෙයින් සමාන වූ අර්ථයක් පළ කරන්නකි.[43] පශ්චාත් කාලීන ව සුභාෂිතයෙහිදු එකී අදහස ම ඉදිරිපත් ව තිබෙනු දක්නට ලැබේ.

"කරදර දුදන පිරිසිඳ දතුව ද සතර
ගොරතර සුපුන් විලසින් කට මිණි ලකර
නරවර සඳුන් තුර වළඳමිනි හැම වර
පර නට විස මැ මිස අම දෙති කවර වර"[44]

ගී විරිතට අනුව රචිත උක්ත සිදත් සඟරා නිදර්ශනය උපදේශ කාව්‍යයන්හි සුලබ ව දක්නට ලැබෙන අලංකාරයක් වන නිදර්ශනාලංකාරය[45], එයිනුත් අසත්ඵල නිදර්ශනාලංකාරය[46] ඇසුරු කොට ගනිමින් ප්‍රබන්ධය කොට තිබේ. "ගතු ගතු ද" යනුවෙන් පළමු පාදය ආරම්භයේ ආදි අව්‍යපේත යමක ලක්ෂණය හෙවත් දකුණු තොහොල් ගීයේ ලක්ෂණය[47] ද යෙදී තිබේ. සිදත් සඟරාවේ එන ***"ගුණෙන් දනා සගන්නේ"***, ***"තැත්නෙනි බව පියව්"***,[48] ***"සජනෙන් මගා පරලෙව්"***, ***"බිගුනි මීලොලින් - කල්ඉක් තඹරෝරේ දඟ නොවා"***,[49] යන නිදසුන් ගී කොටස් ද සදුක්ති ගණයට ඇතුළත් කළ හැකි ය. මෙකී අවසන් පාඨයට සමානතා දක්වන අදහසක් භ්‍රමරාෂ්ටකයෙහි ද සීගිරි ගී අතුරෙහිදු දක්නට ලැබේ.

"මත්බමරු ගුල ඇවිලි (නො) මන්ද් ලොල් වී කිහුමු
ගුමමිනි මල් කෙසුර නො සකසු කළයි හැමූ
කුමුන්ද් වන විද්හෙ (වී සරා) සිසිරැස් හමු
නුයුළ වී ඇ(ය) නැති යි එය් නොවී අපි යමු"[50]

මෙය සංස්කෘත කවීන් අතර මෙන් ම සිංහල කවීන් අතර ද ප්‍රචලිත ව පැවති කාව්‍ය සංකල්පයක් බව පුංචිබණ්ඩා ඒකනායක පවසයි.[51]

බෞද්ධාගමික පරිසරය හා බෞද්ධ දර්ශනය පදනම් කොට ගැනුණු පද්‍ය කොටස් ද සිදත් සඟරා නිදර්ශන අතර විද්‍යමාන වීමෙන් තද් යුගයේ සිංහල පද්‍ය සම්ප්‍රදායයේ රුවගුණ තවත් මානයකින් අනාවරණය කරගැනීමට ලැබේ. ***"මෙතේසුගතිඳු ලෙවන් ගළවන්නේ"***,[52] ***"අගමගිනි කෙලෙස් කැස දැවිණි"***,[53] ***"වනත බැරි මුනිගුණ සියල්"***[54] යන පද්‍යමය නිදර්ශන කොටස් එහි ලා සාධක කොට ගත හැකි ය. බෞද්ධ ග්‍රන්ථයන්ට අන්තර්ගත වී යැයි සිතිය හැකි එම පද්‍ය බණ්ඩ පිළිවෙළින් මාත්‍රා 16 (පදක),[55] මාත්‍රා 14, මාත්‍රා 12 (වසත්)[56] යන අගයයන්ගෙන් යුක්ත වේ. ඒවායෙන් දෙවන උද්ධෘතයෙහි රූපකාලංකාරය ද[57] තෙවැන්නෙහි ආක්ෂේපාලංකාරය ද යෙදී තිබේ.

ආගමික කාව්‍ය මෙන් ම ලෞකික කාව්‍ය පිළිබඳ ව ද මාහැඟි නිදර්ශන සිදත් සඟරාවේ දක්නට ලැබේ. උක්තානුක්තාධිකාරයේ අර්ථ ක්‍රියාවෙන් උක්ත කර්මය විග්‍රහ කිරීම් වස් උද්ධෘත කොට දක්වා ඇති පහත ගීය සෞන්දර්යයාත්මක ආකාරයෙන් සම්ප්‍රභෝග ශෘංගාරය ජනිත කරන්නකි. අන්‍යොන්‍යාසක්ත පුං-ස්ත්‍රී යුග්මයක් ඔවුනොවුන්ට ප්‍රිය වූ සමාගමයට පත් වනුයේ සම්භෝග ශෘංගාරය නම් වේ.[58]

> **"සලෙළු තිළී දැක - පියොවුරුබෙයද පියබඳ**
> **වුහුටෙහි සක්නරද හිස - තැනැවී උපුරනසිනෙව්"** [59]
> (ප්‍රිය කාන්තාවගේ උස් වූ පයෝධර පෙදෙස් නම් පර්වතය දැක සතුටු වූ විනෝදකාමියා විසින් විහිදුවන ලද ඇස් නමැති ඊය පසු ව එයින් උදුරන අදහසින් මෙන් හිස කම්පනය කරවන ලදී.)

මෙහි පළමු පාදයේ අන්තාක්ෂරය ගුරක් ලෙස ගත් කල මෙය ද ගී විරිතට අයත් කළ හැකි ය. මෙහි පියොවුරු බෙයද (පියොවුරු නම් පර්වතය) සක්නරද (ඇස් නම් හීය) යනු රූපකාලංකාරයි. ප්‍රස්තුත

අදහස වක්‍රෝක්ති, ධ්වනිතාර්ථාදි කාව්‍ය සිද්ධාන්තවලට ද අනුගත වන පරිද්දෙන් ඉදිරිපත් ව තිබෙනු පෙනේ. වක්‍රෝක්තිය යෙදී ඇත්තේ ප්‍රස්තුත පුරුෂයා එකී ස්ත්‍රිය හා ආලයෙන් බැඳීම වක්‍රාකාර ව කියා පා ඇති බැවිනි. එසේ ම පියයුරු නම් උස් වූ පර්වතය දැක විහිද වූ දෙඇස් නම් හීය උදුරා ගත නොහී ව හිස කම්පනය කළ බැව් කීමෙන් ධ්වනිතාර්ථවත් වනුයේ තරුණියගේ පියයුරු ආලම්බනය කොට ගනිමින් පුරුෂයා දැඩි අනුරාගයෙන් කැළඹුණු බවයි. මෙම පද්‍යය ද කිසියම් මහා කාව්‍යයක හෝ ඛණ්ඩ කාව්‍යයක ස්ත්‍රී-පුරුෂ ප්‍රිය සමාගමයක් පවසන්නක් විය හැකි ය.

සිදත් සඟරාවේ විභක්ත්‍යධිකාරයේ ආධාර විභක්තිය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී නිදර්ශනත්වයෙන් දක්වා ඇති පහත පද්‍යය ද එම යුගය වන විට පැවති කාව්‍යයක ආ විරහ වැනුමක් විය හැකි ය.

*"බලාවැළදළයුතු - විදුදිවි දහරලඹකෙස්*
*මහමේරකුසු හමුවන - පිය නම් මතුරු දප වන"* [60]
*(විරහී තැනැත්තිය, කොකුන් පෙළ නමැති දළ ඇති, විදුලිය නමැති දිව් ඇති වැහි දහරා නමැති එල්ලෙන කෙස් ඇති මහා වැහි වලාකුළ නමැති රාක්ෂසයා හමු වන කල්හි ප්‍රියයාගේ නාමය නමැති මන්ත්‍රය ජප කරව)*

විරහව හෙවත් විප්‍රලම්භ ශෘංගාරය නම් අන්‍යෝන්‍යාසක්ත පුං-ස්ත්‍රී යුග්මයකගේ අභිෂ්ටාර්ථ සිද්ධිය කිසියම් බාධක හේතුවක් සෙයින් වැළකුණු කල ඔවුනොවුන්ගේ සිත්හි පහළ වන ශෝකී සිතුවිලි සමුදායයක් පෙරටු කොට ගත් ශෘංගාරයයි.[61] පූර්වරාග-මාන-ප්‍රවාස-කරුණ යනුවෙන් විප්‍රලම්භාවස්ථා සතරක් ඇති අතර[62] එයින් ප්‍රවාස විප්‍රලම්භය යනු තාවකාලික වශයෙන් ඇති වන විප්‍රවාසයයි.[63] වර්ෂා ඍතුව, රාත්‍රී කාලය ආදි අවස්ථා ප්‍රවාසීන්ගේ මනස දැඩි ලෙස කැළඹීමට පත් කරවන බව සාහිත්‍ය ලෝකයේ ප්‍රකට ය. සීගිරි ගී අතර ද මෙබඳු වර්ණනා දක්නට ලැබේ.[64] උක්ත සිදත් සඟරා නිදර්ශනය ද ගී විරිතට අනුව ලියැවී ඇත. එහි අලංකාරයක් වශයෙන් යෙදී ඇත්තේ සකල රූපකාලංකාරයයි. ප්‍රස්තුතයේ සියලු අංග රූපක මාර්ගයෙන් දක්වනුයේ සකල රූපක නම් වේ.

සිදත් සඟරාවේ එන, ***"හුණමින් ගුම් දුම්යොනා මියුරු රඟ ගත්"***,[65] ***"පහනැ තඹරන්හි බමන බමරමුළු පිරියෙසැ සරන තිමිර බලල් වලා"***,[66] ***"උකටලියට දලැදිලි දෙනු පියසමාම්හි"***[67] වැනි පාඨ ද පද්‍ය කෘතිවලින් උපුටා ගෙන ඇති බව ඊ. තෙන්නකෝන් අදහස් කරයි.[68] මෙයින් අවසන් උද්ධෘතය පද්‍යමය වෙද පොතකින් ගත් බව පෙනෙන්නේ ය'[69] යනු ඔහුගේ විග්‍රහය වුවත් එය අදූරදර්ශී නිගමනයක් බව පැහැදිලි ය. විරහී භාවයෙන් උකටලී වූවන් පිළිබඳ පැවසෙනුයේ වෙද පොත්වල පමණක් නොවන බැවිනි.

සිදත් කරු උක්තානුක්තාධිකාරයේ අකර්මක ක්‍රියාවෙන් උක්ත කර්මය පැහැදිලි කරනු වස් දක්වා ඇති නිදර්ශනය සචේතනෝත්ප්‍රේක්ෂාලංකාරයෙන් යුක්ත ව ගී විරිතෙන් බඳනා ලද්දකි. සචේතන හෝ අචේතන වස්තුවක් අන් අයුරකින් කල්පනා කිරීම උත්ප්‍රේක්ෂාලංකාරයයි.[70] මෙයින් සචේනෝත්ප්‍රේක්ෂාව සඳහා සියබස්ලකර කරු දක්වන නිදර්ශනය පෙර කී සිදත් සඟරා පද්‍යයේ අර්ථය හා බොහෝ සෙයින් සමාන වූවකි. එහෙයින් එහි අර්ථය සලකා සිදත් කරු විසින් ප්‍රබන්ධය කරන ලද පැදියෙකැයි සිතිය හැකි ය.

සිදත් සඟරා පද්‍යය ***"ගිම්රිවිතෙදිනදන්***
***ගජරජ කුමුටු වනවිල්***
***එහි පිළිබිඹු ඔහු බලා***
***නොසැහැ වනසනමෙනෙනෙව්"***[71]

(ග්‍රීස්ම සූර්යයාගේ තේජසින් තැවුණා වූ ඇත්රජ වනයෙහි වූ විලෙහි කිම්දෙනුයේ හිරුගේ පිළිබිඹුව විල තුළ දැක (ඉවසිය නොහී) ඒ විනාශ කර දමන අදහසින් මෙනි.)

සියබස්ලකර පද්‍යය ***"මැඳුම් පත් රිවි තැවු***
***ලී පත් මතැත් විල්වන්***
***රිවි ගැතියෙනු'පුරන්නට***
***රිසිනැයි කමල් හගිනෙම්"***[72]

(මුදුන්පත් හිරෙන් තැවීමට පත් මතැත් විල පත් වූයේ හිරුට හිතවත් පියුම් උගුලා දමන අදහසින් යැයි සිතමි.)

දණ්ඩින් උත්ප්‍රේක්ෂා නමින් කාව්‍යාදර්ශයේ විග්‍රහ කළ අලංකාරය සියබස්ලකර "අයලසිත්" නමින් ද[73] සිදත් සඟරා කරු "උපේලකර" නමින් ද[74] විග්‍රහ කොට තිබේ. සිදත් කරු උපේලකර නම් අලංකාරය

පූර්වෝක්ත ආකාරයේ භේදවලින් විනිර්මුක්ත ව පොදුවේ විග්‍රහ කරයි. එහි ලා ඔහු දක්වන නිදර්ශනය ද උසස් කාව්‍ය සම්ප්‍රදායයක සාධක ගෙනහැර දක්වන්නකි.

> ***"අපොළතරියොර බිමැ - තනබඳුපෙඳ නොසැහැමෙන්***
> ***බියනෙව් හිඹි නුවන්වන් - කත කන්කපල් පල්ලේ"*** [75]
> (කාන්තාවගේ පියයුරු වැනි වූ පන්දුව නොඉවසා මෙන් නිරතුරු ව ම බිම ගසන කල්හි නයනයන් සදිසි කන්උපුල බියෙන් මෙන් පා තලයේ පතිත විය.)

පන්දුව ප්‍රස්තුත කාන්තාවගේ පියයුරු වැනි බැවින් ඒ පිළිබඳ රෝෂයෙන් ඇය එය පොළොවේ ගසති'යි සිතූ ඇගේ නේත්‍ර සමාන වූ කර්ණෝත්පලය බියට පත් ව පාමුල වැටී ගත් ලෙසකින් මෙහි දක්වා ඇත්තේ ඇය පන්දු කෙළින විට ඇති වන චලනය හේතුවෙන් එය බිම වැටීමේ සිදුවීමයි. එහෙයින් උත්ප්‍රේක්ෂායි. ගී විරිතෙන් රචිත මෙම කව ද පැරණි කාව්‍යයක පුර වැනුමකින් උපුටා ගෙන ඇති පද්‍යයක් විය හැකි ය.[76] මීට සමාන අදහස් සංස්කෘත සාහිත්‍යයේ ද සුලබ වශයෙන් විද්‍යමාන වේ. කාලිදාස විසින් පූර්වයේ ඉදිරිපත් කරන ලද සංකල්ප ඇසුරු කොට ගනිමින් කුමාරදාස කවියා ජානකීහරණයෙහි මෙසේ ඉදිරිපත් කරනුයේ ද ඊට සමාන වූ අදහසකි.

> ***"භෘංගා නිලීනේන සරෝජෂණ්ඩේ***
> ***යෝෂිද්විතීයේන නරාධිපේන***
> ***උත්සාරිතා වක්තුමිවාපරාසාං***
> ***කර්ණාන්තමීයුර්නිහිතාවතංසම්"*** [77]
> (පියුම් සමීපයෙහි සැඟවුණා වූ අඟනක දෙවනු කොට ඇති රජහු විසින් නඟන ලද්දා වූ භෘංගයෝ සෙසු අඟනන්ගේ පිහිටුවන ලද කර්ණපූර ඇති කර්ණාන්තයට කියන්නට මෙන් ගියෝ.)

සිදත් සඟරා කතුවරයාගේ අලංකාර විග්‍රහයෙහි අර්ථාන්තරන්‍යාසාලංකාරය දක්වා නැතත් උක්තානුක්තාධිකාරයේ සකර්මක ක්‍රියාවෙන් උක්ත කර්තෘ පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත් කොට ඇති පහත ගීයෙහි එම අලංකාරය යෙදී තිබේ. ප්‍රස්තුතය වෙනත් අර්ථයක් අතුරෙහි හිඳ පැහැදිලි කිරීම අර්ථාන්තරන්‍යාසාලංකාරයේ ලක්ෂණයයි.[78]

*"රුදුරුබියෙනිතුන් - හදදැදුරට පිවිටු කම්*
*එහිදෝහට කටොල් දෙත් - වත්නට වරුදැ කො රකෙත්"* [79]
(අනංගයා ඊශ්වරයා කෙරෙහි භයෙන් ස්ත්‍රීන්ගේ හදවත නමැති සිදුරට පිවිසිය ද ඔහුහට කරදර දෙති. ශක්තිවන්තයන්ට විරුද්ධ වී කවුරු නම් රකෙත් ද?)

මෙම ගීය ද කර්තෘගේ ම ප්‍රබන්ධයක් විය හැකි ය. ඉෂ්ටානිෂ්ටාධිකාරයේ සහ අලංකාරාධිකාරයේ දැක්වෙන නිදර්ශන පද්‍ය අතර සිදත් සඟරාකරුවා විසින් ම ඡන්දෝලංකාර ග්‍රන්ථ ඇතුළු විවිධ සාහිත්‍ය කෘතීන්හි ආ පද්‍යයන් අනුසාරයෙන් රචනා කරන ලද පබැඳුම් ද ඇති බව පෙනේ.[80] කාව්‍යාදර්ශය, සියබස්ලකර වැනි අලංකාර ග්‍රන්ථවලට ඇතුළත් වන බොහෝ නිදර්ශන පද්‍ය ද එලෙස එම කර්තෘන් විසින් ම ප්‍රබන්ධය කරන ලද රචනායි.

අලංකාරාධිකාරයේ උපමාලංකාරය යටතේ අර්ථ ශ්ලේෂයට හා පද ශ්ලේෂයට නිදර්ශනත්වයෙන් දක්වා ඇති පද්‍යද්වය පැරණි පද්‍ය කෘතියක හමු වූ ඒවා විය හැකි බව ඒ ඒ අභයසිංහ පවසයි.[81] එම පද්‍ය දෙක ම පෙර දැක්වූ නිදසුනෙහි මෙන් ම 8, 11, 11, 11 යන මාත්‍රා අගය යෙදෙන්නා වූ පාද තරකින් යුක්ත ව ගී විරිතට අනුව පබැඳ තිබේ. ඒකස්වරූප වූ පදයෙන් අර්ථ කිහිපයක් ප්‍රකාශ කිරීම ශ්ලේෂාලංකාරයේ ලක්ෂණයයි.[82]

ඒ ඇසුරු කොට ගත් උපමා ශ්ලේෂෝපමා නමි.[83] පදයෙන් පදය ගෙන ශ්ලේෂාර්ථ දනවනුයේ පද ශ්ලේෂයි. අර්ථය සමස්තයක් ව ගෙන ශ්ලේෂාර්ථ දනවනුයේ අර්ථ ශ්ලේෂයි.

පද ශ්ලේෂෝපමාවට සිදත් කරු දක්වා ඇති නිදර්ශනය මෙසේ ය.
*"පියවි රා වඩා - කොස්දඬුපත්ගුණසියෝ*
*දලපල්දුගැද සිටියේ - පැරදි පියුමැය සරණින්"* [84]

අප්‍රස්තුතය ප්‍රස්තුතයට පැරදී ගියේ යැ'යි පවසමින් ප්‍රස්තුතය අප්‍රස්තුතයට වඩා උසස් බව උපමා මාර්ගයෙන් දක්වන්නා වූ මෙම ගීයෙහි පියවි රා, කොස්, දඬු, පත්, ගුණ යනාදි පද ශ්ලේෂාර්ථවත් ය. ඒ අනුව මීට පහත දෙයාකාරයෙන් ම අරුත් දිය හැකි වේ.

"ප්‍රකෘති රාග වර්ධනය කොට කෝෂ, නාල, පත්‍ර, සූත්‍ර සංයෝග ව ජල පංක දුර්ගයෙහි ස්ථිත වූ පියුම ඇයගේ පා තලයෙන් පැරදී ගියේ ය."

"ප්‍රකෘත්‍යනුරාග වර්ධනය කොට කෝෂ්ඨ සේනා වාහන, ෂඩ් ගුණ සංගත ව ජල පංක දුර්ගයෙහි ස්ථිතිය වූ ද ඇයගේ පාද තලයෙන් පරාජිත විය."

සිදත් කරු අර්ථ ශ්ලේෂෝපමාවට දක්වන නිදර්ශනය මෙපරිද්දෙනි,

***"සුවට කෙමිනුලැගි - අඹරතැ රැඳි කොකුම්වන්
තරුපුන් ඇලැ යපනුයේ - වම් තෙනෙ නොමැ ළතික්
රැස්"*** [85]

(ඉතා වටකුරු වූ ක්‍රමයෙන් ඉහළට එසවුණු, අඹර තුළ රැඳුණු, කොකුම් පැහැයෙන් යුතු වූවෙක් ඔබේ සතුරන් ශීත කාලයේ යාපනය (යැපීම) කරයි. ඒ වනිතාවන්ගේ පියයුරු නො ව ළහිරු මඬලයි.)

මෙහි සුවට, කෙමෙනුලැගි (ක්‍රමයෙන් ඉහළට එසවුණු) අඹරතැ රැඳි (අහසෙහි රැඳුණු/ වස්ත්‍රය තුළ රැඳුණු), කොකුම් වන් වැනි විශේෂණ පයෝධර-සූර්ය දෙපාර්ශ්වයට ම පොදු ය. මෙම නිදර්ශන පැරණි පද්‍ය කෘතියක වීරත්වයක් වර්ණනා ෙ කරුණු අවස්ථාවක ඇතුළත් වී තිබුණා විය හැකි ය. කෙසේ වුවත් අසක්දා කව වැනි පුරාණ කාව්‍යවලින් විද්‍යමාන වූ අව්‍යාජ කාව්‍ය රීතිය පසු යුගයේ දී වෙනස් ව යමින් සංස්කෘත ආලංකාරිකයන්ගේ මතවාද අනුව සිංහල කාව්‍ය මාර්ගය හැඩ ගැසී ගිය බවක් ද මෙවැනි නිදර්ශනවලින් පැහැදිලි වේ.

රූපකාලංකාරය සඳහා සිදත් කරු නිදර්ශනත්වයෙන් දක්වා ඇති පහත පද්‍යය ද වීරයකු පිළිබඳ වර්ණනයක් දක්වන්නකි. වීර රසය දනවන එම පද්‍යය ද සංස්කෘත අලංකාරවාදයට අනුව රචනා වූවකි. සඳස්ලකුණේ නොදැක්වෙන ගී විරිතකට අනුව මාත්‍රා 9, 11, 9, 11 වන පරිද්දෙන් පාද හතර යෙදී තිබේ. මෙම පද්‍යයෙහි ප්‍රස්තුතය හා බැඳුණු සියලු ම අංග රූපක මාර්ගයෙන් දක්වා ඇති බැවින් මෙහි යෙදී ඇත්තේ ද සකල රූපකාලංකාරයයි.[86]

*"යසපඬෙරොහු සුපුල් - කෙම් සිසි කෙසුරු ගහරස්*
*සේවලාදල නළ - කෙලෙස් දියව්ලැ බිජී"* [87]
(ඔහුගේ, සඳ නම් පියුම් කෙමිය ද තරුරැස නම් රෙහෙණු
ද සුදු වලා නම් පෙති ද කෙලෙස් නම් දඬුව ද ඇති යසස
නම් පිපුණු සුදු නෙළුම ලෝකය නම් විලෙහි බැබළුණි.)

සිදත් සඟරාවේ එන නිදර්ශන පද්‍යයක් දිට්ඨමංගලිකා කථාප්‍රවෘත්තිය ඇතුළත් පැරණි පද්‍ය කෘතියකින් උපුටා ගෙන ඇති බව ඒ. ඒ. අභයසිංහ අදහස් කරයි.[88] අලංකාරාධිකාරයෙහි නින්දාප්‍රශංසාලංකාරය සඳහා දක්වා ඇති නිදර්ශන පද්‍යය පිළිබඳ ව ය, ඔහු එසේ ප්‍රකාශ කොට ඇත්තේ. නින්දා දක්වන ව්‍යාජයෙන් උසස් ගුණයක් ම ප්‍රකාශ කිරීම එම අලංකාරයේ ලක්ෂණයයි.[89] එය සියබස්ලකරෙහි වදවැනුම් (ව්‍යාජ ස්තුත්‍යලංකාරය) නමින් විග්‍රහ කොට තිබේ.[90]

*"ගනුතු තොපකෙරෙන් - මතඟදැරියසිලිය සැම්*
*පරහු පිරිරූ තදුරෙන් - එබැවිනි හඟිම් මහබා"* [91]

මෙම පද්‍යයට අභයසිංහ අර්ථ දක්වා ඇත්තේ "මහා භාග්‍යවන්තය, අසිපතක් මෙන් කලු මාතංග දැරිය (දිට්ඨමංගලිකා) ඔබ විසින් සරණ පාවා ගත් හෙයින් අන්‍යයෝ ඔබ දුරින් දුරු කළහ'යි සිතමි" යනුවෙනි. එහෙත් මාතංග දාරිකාව (මතඟදැරිය) යනු සැඬොල්දුව යන්නයි. ඊට දිට්ඨමංගලිකා දැරිය යැ'යි අර්ථ කීම[92] සාධාරණ නොවන බව පෙනේ.

මෙම පද්‍යයෙහි සැඬොල් කෙල්ලක විවාහ කර ගත් බවක් පවසමින් නින්දාවක් දක්වා ඇතත් ශ්ලේෂාර්ථ මාර්ගයෙන් කවියා ප්‍රකාශ කරනුයේ තද් පුරුෂයාගේ වීරත්වය ම බව පෙනේ. මතඟදැරි යන්නට "ඇත් බඳ පළාලන" යනුවෙන් ද අර්ථ දිය හැකි වේ.[93] ව්‍යාජස්තුත්‍යලංකාරයෙහි දී ශ්ලේෂය අනිවාර්යයාංගයක් නොවෙතත් රස ප්‍රතීතියෙහි ලා කවියා මෙහි දී ඒ ද පිටිවහල් කොට ගෙන තිබෙනු පෙනේ. මෙම නිදර්ශන පද්‍යය ද මූලාශ්‍රය පැහැදිලි කොට ගත නොහෙන පද්‍යයකි.

අලංකාරාධිකාරයෙහි අන්අලප් (අන්‍යාලාප) නම් අලංකාරය සඳහා සිදත් කරු නිදර්ශනත්වයෙන් දක්වා ඇත්තේ සිව්පද පද්‍යයකි. ප්‍රස්තුතය හැඟවෙන පරිදි අප්‍රස්තුතය වර්ණනා කිරීම අන්‍යාලාප නම් අලංකාරයේ ලක්ෂණයයි.[94] එය සියබස්ලකරෙහි එන සමාසෝක්තියට සමාන වන අලංකාරයකි.

*"මගා මැඟී සුව විසලී මලීයා*
*තිලී දොළී වැස එසලී මලීයා*
*බොමී විමී ලී තුඩු විලි පිලීයා*
*පිලින් නෙලෙන් උලැඟී බැලි මලීයා"* [95]

(මඟෙහි වූ ගිරවෙක් ඉඹුල් ගසෙහි මහත් වූ මල් දැක සතුටු ව ආශාවෙන් යුක්ත ව ඒ ඉඹුල් ගසෙහි වැස පැසුණු ගෙඩියක පැණි බොමි'යි සිතා සොටය යෙදවී ය. සුළඟින් ඉහළට නැගුණු පුළුන් දෙස මලානික ව බලා සිටියේ ය.)

මෙහි ගිරවාගේ මුළා වීම අප්‍රස්තුත මාර්ගයෙන් අන්‍යාකාරයකින් දක්වා ඇති බැවින් මේ සමාසෝක්තියයි. පද්‍යයේ පාදාන්ත දීර්ඝ ලඝුවත්වයෙන් ගත් කල පෙද විරිත (පදක වෘත්තය) ලැබේ. එවිට පද්‍ය පාද ජ'ගණයෙන් ඇරඹී එයින් ම කෙළවර වනු ද දැක ගත හැකි ය. එහෙත් මෙය සිදත් සඟරාව වැනි කෘතියකට ඇතුළු නොකළ යුතු ඉතා දුර්වල ප්‍රබන්ධයක් බව කුමාරතුංග මුනිදාස ප්‍රකාශ කරයි.[96] මෙම පද්‍යය පැරණි සන්දේශ කාව්‍යයක හෝ වෙනත් පද්‍ය කාව්‍යයක මාර්ග වර්ණනයකට හෝ වන වැනුමකට සම්බන්ධ කළ හැකි ය. මෙය දර්ශන ශෘංගාරයෙන් ද යුක්ත වූවකි.

උබබස්ලකර සඳහා සිදත් සඟරා කරු නිදර්ශනත්වයෙන් දක්වන පද්‍යය පිළිබඳ ව ද මෙහි දී අවධානය යොමු කිරීම වැදගත් ය. සමුදුරුගොස් විරිතට අනුව සංවාදාත්මක භාෂාවෙන් හා වක්‍රෝක්තියෙන් ද යුක්ත ව රචනා වී ඇති එම පද්‍යය මෙසේ ය,

*"සඳ වන සිඳු කිය කුඹුයොන නම සතරා*
*කි වී සෙවෙත තො ද වැලිනී යළ තො ගොරා*
*අරුණු කිහෙනි වී කෙරළන් ලැබැ හුරිරා*
*පැටිවනෙදෙසැ යුද පතිරජ දිය ඉසුරා"* [97]

මෙම සංවාදයේ උත්තර-ප්‍රත්‍යුත්තර කියා ගැන්ම සිදු වනුයේ පහත පරිද්දෙනි,

සාගරය - භවති සන්ධ්‍යාවර්ණ නදිය, (සඳවණසිඳු)
මහවලිය - භවත් අගස්තිය කිය,
සාගරය - කවර හෙයින් (මගේ) සතුරාගේ නමින් (මට) ආමන්ත්‍රණය කළෙහි ද?
මහවැලිය - තො ද මගේ සැතිරියගේ නමින් මට ආමන්ත්‍රණය කළෙහි ය.
සාගරය - (වේවා!) වාලුකා නදිය, තෝ ප්‍රකෘතියෙන් ගෞර ය. කවර හෙයකින් අරුණ වර්ණ වූයෙහි ද?
මහවැලිය - කේරලයන්ගේ රුධිරය ලැබ ය.
සාගරය - (සැබව) පතිරජදෙව් තෙමේ ඔය දික්හි යුද ඇරඹවී ද?

මෙය කවියාගේ ම ප්‍රබන්ධයක් ද උද්ධෘත කොට ගත් පද්‍යයක් ද යනු නිශ්චිත ව ම කිව හැකි නොවෙතත් මෙම සංකල්පය සංස්කෘත සාහිත්‍යයෙන් ලබා ගෙන ඇති බව පහත පද්‍යය අධ්‍යයනයේ දී පැහැදිලි වේ.

*"කාලින්දි බ්‍රෑහි කුම්භෝද්භව ජලධිරහං නාම ගෘහ්ණාසි කස්මා*
*ච්ඡත්‍රෝර්මේ නර්මදාහං ත්වමපි වදසි මෙ නාම කස්මාත් සපත්න්‍යාඃ*
*මාලින්‍යං තර්හි කස්මාදනුභවසි මිලත් කජ්ජලෛර්මාලවීනාං*
*නේත්‍රාම්භොභිඃ කිමාසාං සමජනි කුපිතඃ කුන්තලක්ෂෝණිපාලඃ"* [98]

මෙහි දැක්වෙන නර්මදා නදිය වෙනුවට සිදත් සඟරා පද්‍යයේ මහවැලි නදියත් කුන්තල ධරණිපාල වෙනුවට ප්‍රතිරාජ දේව යන්නත් යොදා ගැනීම හැරුණු කල පද්‍ය අතර ප්‍රබල වෙනසක් දක්නට නොලැබේ.

**නිගමනය**

දුහුනන් දැනුම් සඳහා රචනා ෙ කරුණු සිදත් සඟරාවෙහි දී ඒ ඒ ව්‍යාකරණ සිද්ධාන්ත නිදර්ශන මාර්ගයෙන් පැහැදිලි කිරීම සිදත් සඟරා කතුවරයාට අභිමත ව තිබේ. එසේ දක්වා ඇති නිදර්ශන අතර කවියා

විවිධාකාර සිංහල පද්‍ය කෘතිවලින් උද්ධෘත කොට ගත් පද්‍ය හා පද්‍ය කොටස් දැක ගත හැකි ය. ඒ අතර කවියාගේ ම ප්‍රබන්ධ ද නැතැයි කිව නොහේ. වෙනත් කාව්‍යෝපදේශ ග්‍රන්ථවලින් ගත් නිදර්ශන ද ඊට ඇතුළත් වනවා විය හැකි ය. තද් යුගය වන විට පැවති නිර්මාණ සාහිත්‍යයෙන් කවියා උද්ධරණය කොට දක්වා ඇති පද්‍ය උද්ධෘත සිංහල පද්‍ය සාහිත්‍යයේ පැවති විවිධාකාර ප්‍රවණතාවන් හා සම්ප්‍රදායයන් පිළිබඳවත් විවිධාකාර පද්‍ය ආකෘති හා කාව්‍ය ප්‍රවර්ග පිළිබඳවත් අවබෝධයක් ලබා ගැනීමෙහි ලා ඉවහල් කොට ගත හැකි ය. දැනට විද්‍යමාන කෘති කිහිපයකින් මෙන් ම නාමමාත්‍රික ව පැවසෙන ග්‍රන්ථවලින් ද, අල්ප වශයෙන් තොරතුරු වාර්තා වන කෘතිවලින් ද, කුමන කෘතියකට අන්තර්ගත වී ද යන්න පවා දත නොහෙන දැනට නෂ්ටප්‍රාය ව පවත්නා කෘතිවලින් ද උපුටා දක්වා ඇති නිදර්ශන සිදතෙහි ඇතුළත් ව තිබේ. දේශීය කාව්‍ය රීතියේ ලක්ෂණ - සංස්කෘත කාව්‍යයේ ආභාසය, මහා කාව්‍ය - ඛණ්ඩ කාව්‍ය - සන්දේශ කාව්‍ය, ගී අකෘතිය - සීපද ආකෘතිය, විවිධ අලංකාර හා රස භේද ආදි වශයෙන් එම පද්‍ය උද්ධෘත විවිධ මානයන්ගෙන් සාකච්ඡාවට භාජනය කළ හැකි ය. සමස්තයක් වශයෙන් ගත් කල ඒවායෙන් ප්‍රතීයමාන වනුයේ උසස් පද්‍ය සම්ප්‍රදායයක නෂ්ටාවශේෂ බැව් නිගමනය කළ හැකි ය.

**ආන්තික සටහන්:**

1 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 09

2 කව්සිළුමිණ, ඇම්. බී. ආරියපාල සංස්කරණය, කොළඹ, 2004, 4.213

3 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 133

4 කව්සිළුමිණ, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, මරදාන 1969 සංඥාපනය, පි. XVII

5 කව්සිළුමිණ, ඇම්. බී. ආරියපාල සංස්කරණය, කොළඹ, 2004, ප්‍රස්තාවනා, පි. XII

6 එලු සඳස් ලකුණ, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, කොළඹ, 2004, 19 ගීය, පි. 19

7 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 31

8 මුවදෙව්දාවත, රංජිත් වනරතන සංස්කරණය, කොළඹ, 2002, 1 ගීය, පි. 01

9 එලු සඳස් ලකුණ, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, කොළඹ, 2004, 24 ගීය, පි. 22
10 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 85
11 එම, පි. 91
12 එලු සඳස් ලකුණ, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, කොළඹ, 2004, 14 ගීය, පි. 17
13 එම, 50 ගීය, පි. 50
14 සිදත් සඟරාව, කුමාරතුංග මුනිදාස සංස්කරණය, කොළඹ, බු. ව. 2508, පි. 244 සහ
සිදත් සඟරාව, ඒ. ඒ. අභයසිංහ සංස්කරණය, කොළඹ, 1998, පි. 178
15 එලු සඳස් ලකුණ, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, කොළඹ, 2004, 10 ගීය, පි. 16
16 සියබස්ලකර, හේන්පිටගෙදර ඥාණසීහ හිමි, හේන්පිටගෙදර ඥාණතිලක හිමි සංස්කරණය, කොළඹ, 1933., 2.97 ගීය, පි. 71, සහ සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 213
17 කාව්‍යාදර්ශය, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 2009, 3.1, පි. 119
18 පන්සිය පනස් ජාතක පොත, ජී.ඇන්. මුණසිංහ අප්පුහාමි, ඩී.බී. ඇම්. අභයවර්ධන අප්පුහාමි සංස්කරණය, කොළඹ, 1924, පි. 641-643
19 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 09
20 එම, පි. 50
21 එම, පි. 113
22 එම, පි. 114
23 සිදත් සඟරාව, කුමාරතුංග මුනිදාස සංස්කරණය, කොළඹ, බු. ව. 2508, පි. 58
24 අමරසේකර, ගුණදාස, සිංහල කාව්‍ය සම්ප්‍රදාය, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 1996, පි. 26
25 එම, පි. 31
26 ගුණවර්ධන, ඩබ්. ඇෆ් සංස්.ගුත්තිල කාව්‍ය වර්ණනා, ඩබ්. ඇෆ්. ගුණවර්ධන සංස්කරණය, කොළඹ, 1962, පි. lv, cxxiii, cxxv,
Paranavitana, S. (ed), Sigiri Graffiti, London, 1956, p. cxc,
අමරසේකර, ගුණදාස, සිංහල කාව්‍ය සම්ප්‍රදාය, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 1998, පි. 31,
ඩයස්, හර්සන්, ජන සාහිත්‍ය සම්ප්‍රදාය, කොළඹ, 2003, පි. 54,
රත්නායක, දර්ශන, කල්පලතා, එල්ලක්කල, 2009, පි. 46-64
27 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 216
28 එම, පි. 29
29 එම, පි. 50

30 එම, පි. 82
31 ජයසේකර, යූ. ඩී, ගී කවේ වගතුග, කොළඹ, 1962, පි. 51
32 සැළලිහිණි සන්දේශය, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, කොළඹ, 1956, 41 පද්‍යය
33 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 165
34 එලු සඳස් ලකුණ, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, කොළඹ, 2004, 10 ගීය, පි. 60
35 ගම්ලත්, සුචරිත, සම්භාව්‍ය සිංහල කාව්‍යයේ විකාසනය, නුගේගොඩ, 2004, පි. 272
36 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 30
37 එම, පි. 162
38 එලු සඳස් ලකුණ, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, කොළඹ, 2004, 62 ගීය, පි. 56
39 එම, 18 ගීය, පි. 19
40 එම, පි. 19
41 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 28
42 ව්‍යාසකාරය, නාරාවිල පැට්රික් සංස්කරණය, කොළඹ, 1994, 34 පද්‍යය, පි. 30
43 ධම්මරතන හිමි, හිස්සැල්ලේ, සිංහලයේ ද්‍රවිඩ බලපෑම්, නුගේගොඩ, 2001, පි. 128
44 සුභාෂිතය, කුමාරතුංග මුනිදාස සංස්කරණය, කොළඹ, 2504, 37 පද්‍යය, පි. 16
45 සියබස්ලකර, හේන්පිටගෙදර ඥාණසීහ හිමි, හේන්පිටගෙදර ඥාණතිලක හිමි සංස්කරණය, කොළඹ, 1933, 2.326 ගීය, පි. 324
46 එම, 2.328 ගීය, පි. 326
47 කාව්‍යාදර්ශය, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 2009, 3.1, පි. 119 සහ
එලු සඳස් ලකුණ, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, කොළඹ, 2004, 18 ගීය, පි. 19
48 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 88
49 එම, පි. 106
50 Sigiri Graffiti, S Paranavitana, London, 1956, Poem 582, P. 359
51 ඒකනායක, පුංචිබණ්ඩා, චිරන්තන සිංහල සාහිත්‍ය විචාර චින්තනයේ විකාසනය, කොළඹ, 1999, පි. 27
52 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 148
53 එම, පි. 155

54 එම, පි. 159
55 එලු සඳස් ලකුණ, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, කොළඹ, 2004, 56 ගීය, පි. 53
56 එම, 44 ගීය, පි. 46
57 සියබස්ලකර, හේන්පිටගෙදර ඤාණසීහ හිමි, හේන්පිටගෙදර ඤාණතිලක හිමි සංස්කරණය, කොළඹ, 1933, 2.132 ගීය, පි. 98
58 නාට්‍ය ශාස්ත්‍රය (ද්විතීය භාගය), වෝල්ටර් මාරසිංහ පරිවර්තනය, කොළඹ, 2004, පි. 127-128
59 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 182
60 එම, පි. 104
61 නාට්‍ය ශාස්ත්‍රය (ද්විතීය භාගය), වෝල්ටර් මාරසිංහ පරිවර්තනය, කොළඹ, 2004, පි. 127-128
62 සාහිත්‍ය දර්පණය, බාබු භුවන චන්ද්‍ර වසාක, කල්කතා, 1869, 3.213, පි. 77
63 එම, 3.221, පි. 82
64 Sigiri Graffiti, S Paranavitana, London, 1956, Poem 595, P. 367
65 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 99
66 එම, පි. 103
67 එම, 1902, පි. 90
68 සිදත් සඟරාව, ඊ. තෙන්නකෝන් සංස්කරණය, කොළඹ, 1964, පි. lxiv, lxv
69 එම, පි. lxv
70 කාව්‍යාදර්ශය, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 2009, 3.1, පි. 119
71 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 181
72 සියබස්ලකර, හේන්පිටගෙදර ඤාණසීහ හිමි, හේන්පිටගෙදර ඤාණතිලක හිමි සංස්කරණය, කොළඹ, 1933, 2.233 ගීය, පි. 192
73 එම, 2.232 ගීය, පි. 192
74 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 222
75 එම, පි. 222
76 සිදත් සඟරාව, ඒ. ඒ. අභයසිංහ සංස්කරණය, කොළඹ, 1998, පි. 337
77 ජානකීහරණය, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1891, 3.39
78 සියබස්ලකර, හේන්පිටගෙදර ඤාණසීහ හිමි, හේන්පිටගෙදර ඤාණතිලක හිමි සංස්කරණය, කොළඹ, 1933, 2.191 ගී, පි. 148
79 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 181
80 එම, පි. 191, 192, 194, 214

81 සිදත් සඟරාව, ඒ. ඒ. අභයසිංහ සංස්කරණය, කොළඹ, 1998, පි. 329
82 සාහිත්‍ය දර්පණය, බාබු භුවන චන්ද්‍ර වසාක, කල්කතා, 1869, 10.643, පි. 262 සහ සියබස්ලකර, හේන්පිටගෙදර ඥාණසීහ හිමි, හේන්පිටගෙදර ඥාණතිලක හිමි සංස්කරණය, කොළඹ, 1933, 2.295 ගී, පි. 293
83 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 211
84 එම, පි. 212
85 එම, පි. 212
86 සියබස්ලකර, හේන්පිටගෙදර ඥාණසීහ හිමි, හේන්පිටගෙදර ඥාණතිලක හිමි සංස්කරණය, කොළඹ, 1933, 2.137 ගී, පි. 101
87 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 224
88 සිදත් සඟරාව, ඒ. ඒ. අභයසිංහ සංස්කරණය, කොළඹ, 1998, පි. 334
89 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 218
90 සියබස්ලකර, හේන්පිටගෙදර ඥාණසීහ හිමි, හේන්පිටගෙදර ඥාණතිලක හිමි සංස්කරණය, කොළඹ, 1933, 2.323 ගී, පි. 321
91 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 219
92 සිදත් සඟරාව, ඒ. ඒ. අභයසිංහ සංස්කරණය, කොළඹ, 1998, පි. 334
93 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 219
94 එම, පි. 220
95 එම, පි. 221
96 සිදත් සඟරාව, කුමාරතුංග මුනිදාස සංස්කරණය, කොළඹ, බු. ව. 2508, පි. 581
97 සිදත් සඟරාව, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902, පි. 216
98 ගුත්තිල කාව්‍ය වර්ණනා, ඩබ්. ඇෆ්. ගුණවර්ධන සංස්කරණය, කොළඹ, 1962, පි. cxxv

## ආශ්‍රිත ග්‍රන්ථ:

### ප්‍රාථමික මූලාශ්‍රය:

**එලු සඳස් ලකුණ**, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, කොළඹ, 2004
**කව්සිළුමිණ**, ඇම්. බී. ආරියපාල සංස්කරණය, කොළඹ, 2004
**කව්සිළුමිණ**, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, මරදාන 1969
**කාව්‍යාදර්ශය**, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 2009
**ගුත්තිල කාව්‍ය වර්ණනා**, ඩබ්. ඇෆ්. ගුණවර්ධන, කොළඹ, 1962
**ජානකීහරණය**, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1891
**නාට්‍ය ශාස්ත්‍රය** (විතීය භාගය), වෝල්ටර් මාරසිංහ පරිවර්තනය, කොළඹ, 2004,

**පන්සිය පනස් ජාතක පොත** (1වෙනි කණ්ඩය), ජී.ඇන්. මුණසිංහ අප්පුහාමි, ඩී. බී. ඇම්. අභයවර්ධන අප්පුහාමි සංස්රණය, කොළඹ, 1924
**මුවදෙව්දාවත**, රංජිත් වනරතන සංස්කරණය, කොළඹ, 2002
**ව්‍යාසකාරය**, නාරාවිල පැට්රික් සංස්කරණය, කොළඹ, 19940
**සිදත් සඟරාව**, ඒ. ඒ. අභයසිංහ සංස්කරණය, කොළඹ, 1998
**සිදත් සඟරාව**, කහවේ ශ්‍රී සුමංගල රතනසාර හිමි සංස්කරණය, කොළඹ, 1929
**සිදත් සඟරාව**, කුමාරතුංග මුනිදාස සංස්කරණය, කොළඹ, බු. ව. 2508
**සිදත් සඟරාව**, රත්මලානේ ධර්මාරාම හිමි සංස්කරණය, කොළඹ, 1902
**සිදත් සඟරාව**, ද්. තෙන්නකෝන් සංස්කරණය, කොළඹ, 1964
**සියබස්ලකර**, හේන්පිටගෙදර ඥාණසීහ හිමි, හේන්පිටගෙදර ඥාණතිලක හිමි සංස්කරණය, කොළඹ, 1933
**සාහිත්‍ය දර්පණය**, බාබු භුවන චන්ද්‍ර වසාක, කල්කතා, 1869
**සැළලිහිණි සන්දේශය**, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, කොළඹ, 1956
**සුභාෂිතය**, කුමාරතුංග මුනිදාස සංස්කරණය, කොළඹ, 2504
**Sigiri Graffiti**, Paranavitana, S. (ed), London, 1956

**ද්වෛතීයික මූලාශ්‍රයඃ**

අමරසේකර, ගුණදාස, **සිංහල කාව්‍ය සම්ප්‍රදාය**, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 1996
ඒකනායක, පුංචිබණ්ඩා, **චිරන්තන සිංහල සාහිත්‍ය විචාර චින්තනයේ විකාසනය**, කොළඹ, 1999
ගම්ලත්, සුචරිත, **සම්භාව්‍ය සිංහල කාව්‍යයේ විකාසනය**, නුගේගොඩ, 2004
ජයසේකර, යූ. ඩී, **ගී කවේ වගතුග**, කොළඹ, 1962
ඩයස්, හර්සන්, **ජන සාහිත්‍ය සම්ප්‍රදාය**, කොළඹ, 2003
ධම්මරතන හිමි, හිස්සැල්ලේ, **සිංහලයේ ද්‍රවිඩ බලපෑම්**, නුගේගොඩ, 2001
රත්නායක, දර්ශන, **කල්පලතා**, එල්ලක්කල, 2009